Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව 12.0 - පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.5 - තීරණ ගැනීමට විධිමත් ක්‍රමයක් අනුගමනය කරයි.

- අපේක්ෂිත තත්ත්වයත්,පවතින තත්ත්වයත් අතර වෙනසක් පවතින විට එය ගැටළුවක් ලෙස හැඳින්වේ.
- තීරණයක් යනු විකල්ප අතුරින් යෝග්‍යතම විකල්පය තෝරා ගැනීමයි.
- ඒ අනුව තීරණ ගැනීම යනු කිසියම් නිශ්චිත ගැටළුවක් විසඳීම සඳහා ගත යුතු විකල්ප විසඳුම්,ක්‍රියාමාර්ග හඳුනා ගැනීමත්,ඒ අතුරින් සුදුසු විකල්පය තෝරා ගැනීමත් ඇතුළත් ක්‍රියාවලියකි.
- ගැටළුවක් සරල වුවද,සංකීර්ණ වුවද කළමනාකරු එයට විසඳුම් ලබා දිය යුතුය.
- මේ අනුව කළමනාකරුවකු කරන සියලු ම කාර්යයන්හිදී තීරණ ගැනීම ප්‍රධාන වේ.

**<u>අභ්‍යාස</u>**

1.තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළ පියවර මොනවාද?
2.හොඳම විකල්පය තේරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?